**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය - 2021**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ක්ෂය කර අවසන් වී තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.9,100,000 ක් වූ වෑන් රථය පිළිබඳව ශ්‍රී ලංකා රජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ආවරණය කර නොතිබුණු අතර මෙම රථයේ ඵලදායී ජීවන කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | වෑන් රථයෙහි ක්ෂය කළ හැකි වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට අවසන් වී ඇති බව හා එහි අගය ප්‍රත්‍යාගණනය කර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සඳහා තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ශ්‍රී ලංකා රජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි විධිවිධාන වලට පටහැනිව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන් අරමුදලේ බැරට ලබාගත යුතු දායක මුදල , මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් අරමුදල ආරම්භ කළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව රු.75,999,300 ක් වූ හිඟහිටි දායක මුදල් ගිණුම් වලින් අත්හැරී තිබුණි. | අවකරණ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් විසින් චෙක්පත් මගින් මාසිකව එවනු ලබන බව, විවිධ හේතුමත ලැබීම් ප්‍රමාද වීම හේතුවෙන් ලැබීම් සියල්ල ඊට පසු මාසයේදීම ගිණුම්ගත නොවන බව, කාර්යාල විශාල සංඛ්‍යාවකින් මුදල් ලැබෙන නිසා දායක මුදල් නිශ්චිතව ගණනය කර ගැනීමේ අපහසුවක් පවතින බැවින් දායක මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කර ඇති බව හා 2022 වර්ෂයේ සිට උපචිත පදනම මත දායක මුදල් ගිණුම්ගත කරන බව. | -එම- |

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල බාහිර පාර්ශවයන්ගෙන් ආධාර, පරිත්‍යාග හා දායක මුදල් ලෙස ලැබුණු රු.253,775 ක් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ආපසු ගෙවන තැන්පතු ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා ලැබුණු ආධාර හා පරිත්‍යාග වලින් වියදම් කර ඉතිරි වූ මුදල් ජාතික සභාවේ අනුමැතිය මත ඉදිරි වැඩිහිටි දින සැමරුම් වැඩසටහන් වෙනුවෙන් යොදා ගැනීම සඳහා තාවකාලිකව තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති බව. | ආධාර, පරිත්‍යාග හා දායක මුදල් ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාජ ආරක්ෂණ අරමුදලේ බැංකු ගිණුමට ලැබී තිබුණු රු.48,337,714 ක් වූ තැන්පතු මුදලක් හඳුනාගෙන අරමුදල් ශේෂයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අරමුදල් ශේෂය ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් තැපැල් කටයුතු ප්‍රමාදවීම මත බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සමාජ ආරක්ෂණ අරමුදලෙහි දායක මුදල් සෘජුවම බැංකු ජංගම ගිණුමට තැන්පත්කර තිබුණු බව, ඒවායේ තැන්පතු පත්‍රිකා නිසි පරිදි එවා නොමැතිවීම නිසා එම තැන්පතු ගිණුම්වලට ගැනීමේදී ප්‍රමාදයක් සිදුවී ඇති බව හා කඩිනමින් ගිණුම් ගත කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | බැංකු ගිණුමට තැන්පත් කර තිබුණු දායක මුදල් හඳුනාගෙන ගිණුම් ගත කර තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහලේකම් කාර්යාලයේ කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.මිලියන 7 ක භාණ්ඩාගාර ප්‍රදානයන්, ආදායමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකිරීම නිසා මහලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. එසේම ඉකුත් වර්ෂවල මහලේකම් කාර්යාලයේ බැංකු ගිණුමට බැරකර තිබුණු රු.7,563, 822 ක් වූ ක්වූ විවිධ ලැබීම්, ආදායම් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙයින් වටිනාකම රු.7, 289,771 ක්වූ තැන්පතු 48 ක් මේ වන විට ගිණුම්ගත කර ඇති බව, ඉතිරිය සම්බන්ධයෙන් කටුයතු කිරීම සඳහා තැන්පතු සිදුකරන ලද බැංකු ශාඛාවලින් තොරතුරු ඉල්ලුම් කර ඇති බව හා රු. මිලියන 7 ක් වූ භාණ්ඩාගාර ලැබීම් තැන්පතු දෙක මේ වන විට ගිණුම්ගත කර ඇති බව. | අරමුදලේ ආදායම් නිසි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ණයගැතියන්ගෙන් ලැබි වර්ෂයකට වැඩි කාලයක සිට උපලබ්ධි නොවුණු චෙක්පත් 19 කට අදාල රු.7, 283,922 ක වටිනාකම නැවත ණයගැති ශේෂයන්ට ගැලපීමට කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ණයගැති ශේෂය ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | උපලබ්ධි නොවූ තැන්පතු ලෙස පෙන්නුම් කර තිබූ සියලුම අයිතම සම්බන්ධයෙන් වූ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම් නිසි වේලාවේදී ගැලපීමට කටයුතු කළ යුතුය. |

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | -------------------- | ----------------------------------- | -------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 395(ඇ) | බැංකු ජංගම ගිණුම්වල එක් එක් මාසය අවසානයේදී ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත් එසේ පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් ජංගම ගිණුම් මගින් සිදුකරනු ලබන ගනුදෙනුවල වූ වැරදි හා වංචා හෙළිදරව් කරගැනීමට දීර්ඝ කාලයක් ගතවන බව නිරීක්ෂණය විය. | පැවති කොරෝනා වසංගත තත්ත්වය මත කාර්යාල සඳහා නිලධාරීන් ගෙන්වීමේ අපහසුතා හේතුවෙන් සහ අදාල විෂයභාර නිලධාරීට පැවරී තිබූ රාජකාරී බහුලත්වය නිසා ඇතැම් මාසවල බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමට ප්‍රමාද වූ බව හා බැංකු සැසඳුම් සකස් කිරීමේ රාජකාරී 2022 ජනවාරි මස සිට නිලධාරීන් දෙදෙනෙකුට පවරා ඇති අතර එමගින් අදාල කටයුතු නියමිත දිනට පෙර සිදු කිරීමට හැකිවී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඌ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පැවැත්වීම යනාදි මුදල් හා සම්බන්ධ කටයුතු වලට සහභාගී නොවන නිලධාරියෙකු විසින් වුවත් එක් බැංකු ගිණුමකට අදාළ බැංකු සැසඳුම් පිළියෙල | ගිණුම් අංශයේ කාර්යයන් සමාලෝචනය කර නිලධාරීන් අතර විධිමත් වැඩ බෙදීමක් සිදු වන පරිදි මුදල් කටයුතු සිදු නොකරන නිලධාරියෙකු විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම 2022 ජනවාරි මාසයේ සිට සිදු කරන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමට එම ජංගම ගිණුමේ මුදල් හා සම්බන්ධ කටයුතු කරන නිලධාරියාටම පවරා තිබුණි. | | |
| (iii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | කල්ඉකුත් වූ චෙක්පත් අවලංගු කර ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුව තිබුණද රු.509,885 ක් වූ චෙක්පත් 33 ක වලංගු කාලය මාස 6 ක් කල් ඉකුත් වී තිබුණද එසේ කටයුතු කර නොතිබුණි. | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් අදාළ ගෙවීම්ලාභීන් වෙත සිහිකැඳවීමේ ලිපි යොමු කර ලැබුණු ප්‍රතිචාර මත චෙක්පත්වල දින දීර්ඝ කිරීම හා හිලව් චෙක්පත් නිකුත් කිරීම සිදු කර ඇති බව, ප්‍රතිචාර නොලැබෙන චෙක්පත් අවලංගු කර රජයේ ආදායමට ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බව. | -එම- |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට ලබාගෙන තිබුණු දායක මුදල් වලින් වැඩිහිටියන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා උපයෝජනය නොකළ රු.355,846,655 ක් හා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී, එක් එක් වර්ෂයන් තුළ උපයෝජනය නොකළ රු.7,572,048 ක අතිරික්ත මුදලක් බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. එකී අතිරික්ත මුදල් 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 21 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජාතික සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දින බැංකු ජංගම ගිණුමේ ශේෂයෙන් රු. මිලියන 5 කට අධික මුදලක් සමන්විත වූයේ සංවර්ධන නිලධාරීන්ගේ වැන්දඹු හා අනත්දරු අරමුදල වෙනුවෙන් අවකරණය කළ මුදල් හා අනෙකුත් ගෙවීම් තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති මුදල්වලින් බව හා ඒවා කඩිනමින් නිරවුල් කිරීමට හා වියදම් දැරීමට අවශ්‍ය බැවින් එම මුදල් ආයෝජනය කිරීමට හැකියාවක් නොමැති බව. | බැංකු ජංගම් ගිණුම් වල රඳවා තිබුණු අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර මහලේකම් කාර්යාලයේ මූල්‍ය ශක්තිය වර්ධනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 841,077 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,874,301 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,033, 224 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු.7, 205,000 කින් සහ කාර්ය මණ්ඩල පිරිවැය, ගිවිසුම්ගත සේවා වියදම් රු. 17,016,397 කින් වැඩිවීම හා වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන් වියදම්, නඩත්තු වියදම් රු. 19,930,129 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යයන් උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තියේ විධිවිධාන පරිදි වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි. | වැඩිහිටි දත්ත තොරතුරු කළමනාකරණ පද්ධතිය මේ වනවිට දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි දත්ත ඇතුළත් කර ප්‍රකාශයට පත් කර ඇති බව. | වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුළත් පරිපූර්ණ දත්ත පද්ධතියක් පිළියෙල කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, අභිමානය ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම හා පසුවිපරම් කටයුතු කිරීමට අදාළ පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමුවී නොතිබුණි. | 2021 වර්ෂයට අදාළව ගාල්ල, මාතර, හම්බන්තොට, යාපනය, මන්නාරම, අම්පාර යන දිස්ත්‍රික්ක වල පසුවිපරම් කටයුතු සිදු කර ඇති බව. | වැඩිහිටි සුබසාධන කාර්යභාරයන් ඵලදායි ලෙස ඉටුකිරීම පිළිබඳ ඇගයීම හා පසුවිපරම් කටයුතු වෙනුවෙන් පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධ්‍යක්ෂවරයාගේ නිල රථය ලෙස භාවිතා කළ පිරිවැය රු.5,795,000 ක්වූ මෝටර් රථය, අධ්‍යක්ෂවරයා විසින්ම පැදවීම සිදුකර තිබියදී අනතුරට පත් වී ඉන් රථයේ ඉදිරිපසට සම්පූර්ණ වශයෙන් අලාභ හානි සිදුවී තිබුණි. අනතුර සිදු වී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(3) පරිදි අනතුර පිළිබඳ විස්තර ඇතුළත් ප්‍රාරම්භක වාර්තාව හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අලාභයේ | රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි අධ්‍යක්ෂ සඳහා නිල රථයක් වෙන් කර ඇති අතර එම රථය ධාවනය කිරීමේදී අනතුරට පත්ව ඇති බව, අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවක් මඟින් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව, පැවති අයහපත් ආර්ථික තත්ත්වය මත අමතර කොටස් සපයා ගැනීම දුෂ්කර වීම නිසා අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු | අනතුරෙන් සිදුවූ අලාභය පූර්ණය කර ගැනීමට හා අනතුරට වගකිව යුතු පාර්ශවයන් සඳහා විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම නිශ්චිත ලෙස ගණනය කිරීම හා ඊට වගකිව යුතු පාර්ශවයන් සඳහා විනය කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | සකස් කර ගැනීම ගැටළුකාරී වූ බව, මේ වන විට ඒ සඳහා වන ඇස්තමේන්තුවක් ශ්‍රී ලංකා රක්ෂණ සමාගම වෙත යොමු කර රක්ෂණ සමාගමේ අනුමැතිය ලැබීමෙන් පසු කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදු කර රථය ධාවනයට යෙදවීමට හැකි බව. | |
| (ඇ) | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 අගෝස්තු 30 දින ලැබී තිබුණද, මුදල් රෙගුලාසි 876(2) විධිවිධාන පරිදි ඊට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු පනතක් මඟින් නෛතික භාවයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී 2016 වර්ෂයේ අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල රු.මිලියන 2,826.20 ක් හා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හෝ නොමැතිව 2016 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුල රු.මිලියන 308.86 ක් අරමුදලට අයකරගෙන තිබුණි. එසේම අරමුදලට 2016-2018 කාලය තුළ රු. මිලියන 1,384.27 ක හා 2019-2021 කාලය තුල රු. මිලියන 1,441.93 ක අරමුදල් රැස්කර තිබුණද, අරමුදලේ කාර්යයන් සඳහා ඉහත පළමු වර්ෂ 03 තුල අරමුදල් උපයෝජනය කර නොතිබුණු අතර දෙවන වර්ෂ 03 තුල ද උපයෝජනය කර තිබුණේ රු.මිලියන 573.32 ක් පමණකි. එහි වාර්ෂික ප්‍රතිශතය සියයට 59 ක් ,සියයට 26 ක් හා සියයට 32 ක් විය. | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැඩිහිටි දීමනා ලබන ප්‍රතිලාභියෙකුගෙන් රු. 100 බැගින් ලැබී දායක මුදල් අරමුදලට රැස් කර ඇති බව, වැඩිහිටි දීමනාලාභීන්ගේ සංඛ්‍යාව පදනම් කරගෙන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවනු ලැබුවද මිය යාම, පදිංචිය වෙනස් කිරීම ආදී හේතු මත සත්‍ය වශයෙන් ගෙවනු ලබන දීමනා ප්‍රමාණය වෙනස් බව, අරමුදල 2016 වර්ෂයේ සිට ආරම්භ කළ අතර වැඩසටහන් 2019 වර්ෂයේ අග භාගයේ සිට ක්‍රියාත්මක කළ බව, 2020 හා 2021 වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා යාමට අපහසුවූ බව, අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම සඳහා පියවර ගෙන ඇති බව දන්වමි. | වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු පනතක් මඟින් නෛතික භාවයක් ඇතිකිරීමට හා අරමුදලට රැස්කර ගත් මුදල් අරමුදලේ කාර්යයන් ඵලදායී ලෙස ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය උදෙසා සමාලෝචිත වර්ෂය තුල ශ්‍රවණ උපකරණ 700 ක් ලබාදීමට රු.මිලියන 13.5 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, රු.මිලියන 7.5 ක් උපයෝජනය කර උපකරණ 419 ක් පමණක් ලබාදී තිබුණි. | 2020 වර්ෂයේ ශ්‍රවණ උපකරණ 1000 ක් ලබා දීමට සැලසුම් කර තිබුනද කොරෝනා වසංගතය නිසා ප්‍රතිලාභීන්ගෙන් ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අඩුවූ බව, එබැවින් ඉලක්කගත ප්‍රතිලාභීන්ට ශ්‍රවන උපකරණ ලබා දීම අපහසුවූ බව, කොරෝනා වසංගතය හමුවේ ප්‍රතිලාභීන් නොපැමිණීම හේතුවෙන් 2020 වර්ෂයට අදාලව | ඉලක්කගත කාර්ය සාධනය පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිලාභීන් 295 දෙනෙකු සඳහා ශ්‍රවණ උපකරණ 295 ක් ලබා දීම සිදු වූයේ 2021 වර්ෂයේදී බව හා 2021 වර්ෂයේ ශ්‍රවන උපකරණ 419 ක් ලබා දීමට කටයුතු කළ බව. | |
| (ආ) | වැඩිහිටි ආරක්ෂණ අරමුදල ස්ථාපිත කළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් විවිධ ක්ෂේත්‍ර යටතේ මූලික කාර්යයන් 10 ඉටුකිරීමට ඉලක්කගත කර තිබුණ ද, එකී කාර්යයන් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවතිණි. වැඩිහිටියන් වෙනුවෙන් ස්වයං රැකියා ආධාර ලබාදීම සහ ඒ තුලින් ඔවුන් නිෂ්පාදනය කරනු කරන දෑ අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම,ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කිරීම,වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම යනාදී ව්‍යාපෘති කටුයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට වැඩසටහන් රාශියක් සැලසුම් කර තිබුණද කොරෝනා වසංගතය හේතුවෙන් අදාල නිලධාරීන්ට ක්ෂේත්‍රය තුළට යාම, පුද්ගලයින් ඒකරාශී කිරීමට නොහැකි වීම, සේවයට කැඳවීම සීමා කිරීම නිසා සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපහසු වූ බව හා මෙම තත්ත්වය මත සැලසුම් කළ වැඩසටහන් නැවත සංශෝධනයට ලක් කිරීමට සිදුවූ බව. | ඉලක්කගත කාර්යයන් සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර වැඩිහිටියන්ගේ සුභසාධනය සැලසීමේ කටයුතු කාර්යක්ෂම කළ යුතුය. |
| (ඇ) | වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු - ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙත මාසිකව රු.2,000 ක දීමනාව ගෙවීමට අදාලව දීමනාලාභීන්ගේ විස්තර ඇතුළත් ලේඛනයක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දීමනා ගෙවීම පිළිබඳව නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම, අදාල තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීම හා එය යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි. තවද ගෙවූ දීමනා පිළිබඳ තොරතුරු ඇතුලත් සාරාංශ වියදම් වාර්තාවක් මසක් අවසාන වී ඊළඟ මාස 30 වන දිනට පෙර ලබා ගැනීමට මහ ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණු අතර දීමනා ගෙවීම පිළිබඳව පසු විපරම් කිරීම සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වන විට දීමනාලාභින් පිළිබඳ දත්ත රැස් කිරීමේ කටයුතු , වැඩිහිටි විෂය භාර නිලධාරීන් ප්‍රමාණාත්මකව හා කාර්යක්ෂම පරිදි ඉටුකර නොතිබුණි.මේ සම්බන්ධයෙන් වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ ද අවධානය යොමු වී නොතිබුණි. වැඩිහිටි | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දීමනාලාභීන් සංඛ්‍යාව ඇතුලත්ව ඉදිරිපත් කරනු ලබන ලේඛනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදෙන බව, දීමනාලාභීන්ගේ විස්තර ඇතුලත් ලේඛනයක් ලබා දීමට කටයුතු නොකරන බව, නොගෙවූ ඉතිරි දීමනා මුදල් දීමනා ගෙවූ මසදීම නැවත නොලැබෙන අතර ඊළඟ මසදී ද ලැබෙන නිසා වාර්තා වල වෙනස්කම් පවතින බව, ඉතිරි දීමනා මුදල් ගෙන්වා ගැනීමේදී ඊට අදාල වාර්තා එම මස තුළදීම ලබාගැනීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත දන්වා ඇති බව, ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලබාදෙන වාර්තා අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් මාසික සාරාංශ සකස් කර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කරන බව, 2020 හා 2021 වර්ෂ වල පැවැති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් එම විස්තරාත්මක | දීමනා ගෙවීමේදී වැරදි හා අක්‍රමිකතාවයන් වලක්වා ගැනීමට මනා පාලනයකින් යුක්තව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පාලනයක් පවත්වා නොතිබීම හා පසු විපරම් කටයුතු ඉටුකර නොතිබීම හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ වල 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල රු.476,000 ක් වූ මූල්‍ය වංචා සිදු වී තිබුණු බව විගණනයේදී අනාවරණය කරගෙන තිබුණි. | වාර්තා හා මාසික සාරාංශ වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදීමේ ප්‍රමාදයක් වූ බව, ඉදිරියේදී නියමිත පරිදි වාර්තා ලබාගැනීමට කටයුතු කරන බව. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහලේකම් කාර්යාලයේ කටයුතු ඉටුකිරීමේ අපහසුතාවය හා වාහන නොමැති වීම යනාදී හේතු දක්වා කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට අයත් අළුත්වැඩියා කෙරෙමින් පැවති මොන්ටෙරෝ වර්ගයේ ජීප් රථයත්, කාර්යාලයේ රාජකාරී සඳහා ධාවනයට ඉල්ලාගෙන, අමාත්‍යාංශයේ ධාවන කාලයේදී සිදුකළ අලුත්වැඩියා වෙනුවෙන් රු. 1,585,521 ක් වූ වියදම් අවිධිමත් ලෙස මහලේකම් කාර්යාලයෙන් ගෙවීම් කර හිටපු අධ්‍යක්ෂවරයාගේ නිල රථය ලෙස ධාවනයට යොදවා ගෙන තිබුණි. අලුත්වැඩියා වියදමෙන් රු.1,093,823 ක් ජාතික සභාවේ අනුමැතියකින් තොරව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලෙන් ගෙවා තිබුණු අතර ඊට ජාතික සභාවේ එකඟතාවය නොලැබීම හේතුවෙන් වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අරමුදලෙන්, වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට රු.1,093,823 ක් ආපසු ගෙවීම් කර තිබුණි. එවකට හිටපු අධ්‍යක්ෂවරයා සේවා ස්ථාන මාරු වී යාමෙන් පසු අමාත්‍යාංශය විසින් කළ ඉල්ලීම අනුව 2020 දෙසැම්බර් 10 දින ජීප් රථය අමාත්‍යාංශයට භාර දී තිබුණි. දැරූ අලුත්වැඩියා වියදමට ප්‍රමාණවත් ලෙස ධාවනයට යෙදවීම වෙනුවෙන් ජීප් රථය රඳවාගැනීමට හෝ වැයකළ අලුත්වැඩියා වියදම අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබීම හේතුවෙන් | කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය ලේකම්ගේ අනුමැතිය මත අලුත්වැඩියාව සඳහා වියදම් වී ඇති රු.1,585,521 ක මුදල අදාල ආයතනය වෙත ගෙවා එවකට සිටි අධ්‍යක්ෂගේ නිල රථය ලෙස භාවිතා කිරිම සඳහා ජීප් රථය ලබා ගෙන ඇති බව, රථයේ අලුත්වැඩියා වියදමෙන් රු.1,093,823 ක් වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ගෙවා ඇති අතර සභාව ලබා දුන් උපදෙස් වලට අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.1,093,823 ක් වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල වෙත බැර කර ඇති බව, කොවිඩ් වසංගත තත්වය මත රාජකාරි කටයුතු සඳහා කාර්යාල විවෘත නොකිරීම නිසා සංචිත වාහන හා නිල වාහන ධාවනය කිරීම අවමවූ බව හා අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි වැය වු මුදල ලබා ගැනීම සඳහා ඉල්ලීම් සිදු කළ බව. | අළුත්වැඩියා වෙනුවෙන් වැයකළ මුදල අමාත්‍යාංශයෙන් අයකර ගෙන මහලේකම් කාර්යාලයේ අරමුදලට සිදුකර තිබුණු පාඩුව පූර්ණය කිරීමට කටයුතු කළ යුතුය. |

මහලේකම් කාර්යාලයට රු. 1,585,521 ක පාඩුවක් සිදුව තිබුණු අතර වර්ෂ 02 කට ආසන්න කාලයක් ඉකුත් වී තිබුණ ද, දැරූ වියදම් පූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා 2016 වර්ෂයේදී රජයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු.4,245,807 ක් ලබාදී තිබුණු අතර ඉන් රු.2,438,715 ක් වැය දරා තිබුණ ද ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092 ක් වූ මුදල නිශ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 05 ක පමණ කාලයක් රඳවාගෙන තිබුණි. | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාල කටයුතු අවසන් වී නොමැති බැවින් ඒ සඳහා දැරීමට අවශ්‍ය වන මුදල් තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු වල දුර්වල ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම කිරීමටත් ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් කඩිනම් කළ යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආබාධිත වැඩිහිටියන් 925 දෙනෙකු සඳහා අත්වාරු, වෝකර්, කොමඩ්, රෝදපුටු සහ කිහිළිකරු යන ආබාධිත උපකරණ ලබාදීමට රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, ආබාධිත උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පැවති දීර්ඝ කාල ප්‍රමාදයන් හේතුවෙන් එකී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම අත්හිටුවා 2022 වර්ෂය දක්වා කල්දමා තිබුණි. | අබාධිත උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ක්‍රමවේදයට ආරම්භ කලද කොරෝනා වසංගත තත්ත්වය මත සේවකයින් සේවයට කැඳවීම සීමා කර තිබීම හා රට වසා තැබීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කාල ප්‍රමාදයක් සිදුවූ බව, රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය සීඝ්‍ර ලෙස ඉහළ යාමත්, ආනයනික භාණ්ඩ ගෙන්වීම සීමා කිරීම හේතුවෙන් අදාල සැපයුම් ආයතනය උපකරණ ලබා දීමට නොහැකි බව දැනුම් දීමත් සමඟ ජාතික සභාවේ අනුමැතිය පරිදි උපකරණ මිළදී ගැනීම නතර කළ බව. | ප්‍රසම්පාදනයන් කාර්යක්ෂම කර ව්‍යාපෘති කටයුතු ඵලදායි ලෙස සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහලේකම් කාර්යාලය සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතියික සහ ප්‍රාථමික ගණවලට අදාලව කාර්යය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 129 ක් වූ අතර, තථ්‍ය කාර්යමණ්ඩලය 117 ක් හා පුරප්පාඩු 12 ක් විය. අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන), සහකාර අධ්‍යක්ෂ (පාලන), ගණකාධිකාරී, නීති නිලධාරී, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) කොන්ත්‍රාත්, වශයෙන් ජ්‍යෙෂ්ඨ ගණයේ තනතුරු 06 ක් හා තෘතීයික සේවා ගණයේ පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩු පැවති අතර වැඩිහිටි මහලේකම් කාර්යාලය 2000 වර්ෂයේ සංස්ථාපනය කළ දින සිට වර්ෂ 21 ක් ඉකුත් වී තිබුණද එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ සහ ගණකාධිකාරී තනතුරු 02 සඳහා ද්විතියන පදනම යටතේ හා පරිපාලන නිලධාරී තනතුර සඳහා වැඩ බැලීම සඳහා තාවකාලිකව පත්කිරිම් කර තිබුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල විශාල වශයෙන් පුරප්පාඩු පැවතීම මත ආයතනයේ පරිපාලන හා කාර්යය කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | බඳවාගැනීම් පරිපාටිය අනුමත කර තිබුනේ 2011 ජනවාරි 28 දින දීය. සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර 2020 ජුලි 22 දිනද, නීති නිලධාරී තනතුර 2021 ජනවාරි 29 දිනද, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර 2017 ජනවාරි 31 දිනද අනුමත කර ඇති බව, එම තනතුරු සඳහා ද්විතීයන, වැඩ බැලීමේ හෝ රාජකාරි ආවරණය කිරීමේ පදනම මත වරින් වර රේඛීය අමාත්‍යාංශය විසින් පත් කිරීම් සිදු කර ඇත. පරිපාලන නිලධාරි තනතුරට අනුමැතිය 2009 ඔක්තෝබරි 22 දින හා බඳවාගැනීම් පරිපාටියට 2011 ජනවාරි 28 වන දින අනුමැතිය ලැබී තිබුණු බව, එම තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ඇති බව, අංක 02/2020 දරන චක්‍රලේඛය මගින් බඳවාගැනීම් සීමා කිරීම හේතුවෙන් අදාල බඳවාගැනීම් සිදු නොකරන ලද අතර බඳවාගැනීම් සඳහා රජයේ අවසරය ලද පසු එම තනතුරු වලට කඩිනමින් බඳවා ගැනීම් සිදු කරන බව. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වල දිගු කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කර මහ ලේකම් කාර්යාලයේ පරිපාලන හා කාර්යය කටයුතු විධිමත් කිරීමටත් කාර්යක්ෂම කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | --------------------------------- | ------------- |
| නවෝත්පාදන ප්‍රවේශයන් මත කඩිනම්, කාර්යක්ෂම හා සඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අපේක්ෂිත ප්‍රතිඵල ලභාකර ගැනීම තුලින් ඉලක්කගත ප්‍රජාවගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සාක්ෂාත් කරගෙන ඇති බව තහවුරු කරගැනීම සහ ඒ සඳහා මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම හා අනුගමනය කර ඇති ක්‍රමවේද, පිළිවෙත් හා ප්‍රතිපත්ති යනාදියේ නිවැරදි බව තහවුරු කරගැනීමට අදාල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු කරන්නේ එක් කළමනාකරණ සේවා නිලධාරිනියක වන අතර ඇයද වෙනත් විෂයක කටයුතු කරන අතරතුර මෙම අංශයේද කටයුතු කරන බව හා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන පරීක්ෂාවන් සිදු කර ඇති බව. | මහලේකම් කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය හා අනුගමනය කළ ක්‍රමවේද හා පිළිවෙත් වල නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා වන අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් ලෙස ඉටුකළ යුතුය. |